# සමබිමට පියවරක්

මැතිවරණ වියදම් සීමාකිරීමේ නීතිය

# சமதளத்திற்கான முனைப்பு


தேர்தல் செலவினத்தை ஒழுங்குபடுத்துதல் சட்டம்




PAFFREL

# සමබිමට පියවරක්

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත
පිළිබඳ සරල හැඳින්වීමක්





පැෆ්රල් සංවිධානය
2023

# සමබිමට පියවරක්

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත
පිළිබඳ සරල හැඳින්වීමක්


**ප්‍රථම මුද්‍රණය** - 2023 ජනවාරි

**සම්පාදනය**
නීතිඥ ජගත් ලියන ආරච්චි

**ප්‍රකාශනය**
පැෆ්රල් සංවිධානය

නො. 16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.
Tel: 011 2 558 570/1   Fax: 011 2 558 572
paffrel@sltnet.lk
www.paffrel.lk

**පිටු සැකැස්ම**
පැෆ්රල් මාධ්‍ය ඒකකය

# සමබිමට පියවරක්

ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංගයක් වන ඡන්ද බලය සර්ව සාධාරණ අයුරින් අභ්‍යාස කළහැකි වන්නේ සමබිමක මැතිවරණය පැවැත්වුවහොත් පමණි. එසේ නොමැතිව මූල්‍යමය සාධකය මැතිවරණ ක්‍රියාවලිය තුළ තීරණාත්මක සාධකයක් වන්නේ නම් ඉන් ජනිත වන ප්‍රතිඵලය සැබෑ ජනමතය නිරූපනය වන්නක් දැයි නැවත නැවතත් සිතා බැලිය යුතු කරුණකි.

එවැනි වතාවරණයක් තුළ මැතිවරණ වියදම් නියාමනය කළ යුතු බවට වන සංවාදය ඉතිහාසයේ දශක දෙකකට වඩා අතීතයට දිව යන්නකි. මෑත කාලීනව එකී සංවාදය ප්‍රබල ලෙසින් මතු වූ අතර 2016 වර්ෂයේ එවකට පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වූ ෆයිසර් මුස්තාපා මහතාගේ නායකත්වයෙන් යුත් පළාත් පාලන ක්‍රමය සංශෝධන කමිටුවේදී පැෆ්රල් සංවිධානය මෙම කරුණු මතු කළ අතර එහිදී ඇතිවූ එකඟතාවය මත මේ පිළිබඳව උනන්දුවක් දක්වන නිරීක්ෂණ සංවිධාන, සමාජ ක්‍රියාකාරිකයන්ගේ මෙන්ම ප්‍රාමාණික දැනුමක් සහිත විද්වතුන්ගේද දේශපාලන පක්ෂ හා මැතිවරණ කොමිෂන් සභාවේ ද අදහස් සැලකිල්ලට ගනිමින් 2016 වර්ෂයේ මූලික කෙටුම්පතක් සකස් කරන ලදී. එකී කෙටුම්පත එවකට ජනාධිපතිවරයා වූ මෛත්‍රීපාල සිරිසේන මහතා මෙන්ම විශේෂයෙන් මැතිවරණ කොමිෂන් සභාවටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාටමත් ලබාදීමට කටයුතු කරන ලදී.

ඉන්පසු මැතිවරණ කොමිෂන් සභාවේ මැදිහත් වීම මත වඩා ශක්තිමත් නෛතික ප්‍රතිපාදන සහිතව නව කෙටුම්පතක් සකස් කරන ලද අතර එහි ගෞරවය එවකට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය, නලින් අබේසේකර මහතා ප්‍රමුඛ මැතිවරණ කොමිෂන් සභාවට හිමිවිය යුතුය. එහෙත් එකී කෙටුම්පතද නීතියක් බවට පත් නොවූ අතර එය නීතියක් බවට පත්කර ගැනීමට, ඉන් අනතුරුව මැතිවරණ කොමිෂන් සභාවට පත් වූ නීතිඥ නිමල් පුංචිහේවා මහතා ඇතුළු කොමිෂන් සභාව හා කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන් ක්‍රියාකළ අතර එහි ගෞරවය ඔවුන්ට හිමි විය යුතුය. එමෙන්ම මෙම පනත අඩුපාඩු සහිතව හෝ සම්මත කිරීමට දායකවූ ජනාධිපතිතුමන්ට අධිකරණ අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය හා සහයදුන් සියළු මහජන නියෝජිතයින්ට ස්තූතිවන්ත විය යුතුය.

පැෆ්රල් සංවිධානයේ මූලිකත්වයෙන් සකස් කළ මූලික කෙටුම් පතෙහි තිබූ බොහෝ සාධනීය කරුණු මෙකී පනත මගින් ආවරණය නොවීම ගැන යම් කනස්සල්ලක් අපට ඇතත් ආරම්භයක් ලෙස මෙවැනි පනතක් හෝ ගෙන ඒම සාධනීය කරුණක් බව අපගේ විශ්වාසයයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කර තිබියදී මෙම පනත සම්මත කිරීම හරහා එය ඡන්ද විමසීම පැවැත්වීමට අභියෝගයක් වේ යැයි අප තුළ සැකයක් ජනිත වී තිබූ මොහොතක නීතිය සම්මත වී දින 2 කටත් අඩු කාලයක් තුළ පනතට අදාළ මූල්‍ය සීමාව තීරණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් ගත් ක්‍රියාමාර්ග සඳහා අපගේ විශේෂ ස්තූතිය හිමිවේ.

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ සිට නීතියක් බවට පත්වන මැතිවරණ වියදම් නියාමනය යථාර්තයක් බවට පත්කර ගැනීම දේශපාලන පක්ෂවල මෙන්ම උනන්දුවක් දක්වන පුරවැසියන්ගේ ප්‍රමුඛ වගකීමක් බව අප අවධාරණය කරමු. පනතින් නියම කර ඇති ප්‍රමාණයන් ඉක්මවා මුදල් වියදම් කරන්නේ නම් ඒ පිළිබඳව අවධානයෙන් සිට අවශ්‍ය මැදිහත්වීම් කළ යුතුය. මැතිවරණ වියදම් නියාමනයට අදාළ නෛතික තත්ත්වයන් ප්‍රායෝගික භාවිතාවේ යොදවන තරමට දේශපාලන ක්‍රියාධරයන් යම් ශික්ෂණයක් පනවා ගනු ඇත. එකී නීතියට අනුගතව ක්‍රියාකරනු ඇත. එකී භාවිතය හරහා යම් කාලසීමාවක් තුළ මැතිවරණයන් සඳහා වන සමබිමක් නිර්මාණය කර ගැනීමට හැකි වනු ඇත.

මැතිවරණ වියදම් නියාමන පනතට අදාළව සරල බසින් ලියවුනු පොත් පිංචක් එළි දක්වන මොහොතේදී එකී නීතිය යථාර්තයක් බවට පත්කිරීමට දායකත්වයක් දක්වන ලද හිටපු මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ද වත්මන් මැතිවරණ කොමිෂන් සභාවට හා එහි නිලධාරීන්ට ද ඊට යෝජනා එක්කළ දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන හා සවිමත් කිරීමට ක්‍රියාකළ, CMEV, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ඇතුළු සහෝදර නිරීක්ෂණ සංවිධාන වලටද මුල් කෙටුම් පත සැකසීම සඳහා මා සමග ඊට දායකත්වයක් දක්වන ලද නීතිඥ ජගත් ලියනආරච්චි මහතා සහ නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ මහතාටද අපගේ කෘතවේදීත්වය පලකළ යුතුය.

රෝහණ හෙට්ටිආරච්චි
**විධායක අධ්‍යක්ෂ**
**පැෆ්රල්**

**සමබිමට පියවරක්**

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳ සරල හැඳින්වීමක්

**අන්තර්ගතය** **පිටු අංකය**


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 06 |
| 2. | මැතිවරණ වියදම් නියාමන පනතේ මූලිකාංග | 07 |
| 3. | පනත මගින් වියදම් නියාමනය කරනු ලබන මැතිවරණ | 07 |
| 4. | පනත මගින් නියාමනය වන පුද්ගලයන් සහ කණ්ඩායම් | 08 |
| 5. | මැතිවරණ වියදම් සීමාව | 08 |
| 6. | මැතිවරණ වියදම් සඳහා පරිත්‍යාග භාරගැනීම තහනම් මූලාශ්‍ර | 09 |
| 7. | පරිත්‍යාග සහ වියදම් වාර්තාව භාරදීමේ වගකීම | 10 |
| 8. | පරිත්‍යාග පිළිබඳ වාර්තාවට ඇතුළත් විය යුතු ලැබීම් | 10 |
| 9. | ප්‍රචාරක වියදම් වාර්තාවට ඇතුළත් කළ යුතු වියදම් | 11 |
| 10. | වියදම් වාර්තාවට අදාළ නොවන වියදම් | 12 |
| 11. | මැතිවරණ වියදම් වාර්තාව ජනතාවට විවෘත කිරීම | 12 |
| 12. | පනත යටතේ වැරදි සහ දඬුවම් | 12 |
| 13. | මැතිවරණ වියදම් නියාමනය සහ මැතිවරණ පෙත්සම් | 14 |
| 14. | පාර්ශවයන්ගේ වගකීම් | 15 |
| 15. | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 සඳහා වියදම් සීමාව | 17 |

# 01. හැඳින්වීම

නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා සෑම අපේක්ෂකයකුටම සම තරඟ බිමක් නිර්මාණය කිරීම සහ රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා අවභාවිතා කිරීම වැළැක්වීම මෙන්ම මැතිවරණ ක්‍රියාවලිය සඳහා විදේශ රාජ්‍ය හෝ සංවිධාන මැදිහත් වීම වැළැක්වීමද මැතිවරණ වියදම් නියාමනය මගින් සිදුවේ.

නිරීක්ෂණ සංවිධාන දීර්ඝ කාලයක් තිස්සේ මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමන නීතියක අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කළ අතර ඒ පිළිබඳව කෙටුම්පතක්ද සම්පාදනය කරන ලදී. 2018-19 වසර වලදී මැතිවරණ කොමිෂන් සභාවද මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමන කෙටුම්පතක් සම්පාදනය කරන ලදී.

රජයන් කිහිපයක් මෙවැනි නීතියක අවශ්‍යතාවය පිලිගෙන තිබුනද කෙටුම්පත ගැසට් පත්‍රයේ පලකරන ලද්දේ 2022 නොවැම්බර් 29 දිනදීය. මෙම කෙටුම්පත අධිකරණ අමාත්‍යවරයා විසින් එය 2022 දෙසැම්බර් 8 දින පාර්ලිමේන්තුවට පළමුවර කියවීම සඳහා ඉදිරිපත් කරන ලදී.

එකී කෙටුම්පතේ තිබූ මූලික අඩුපාඩුකම් හේතුවෙන් කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාණුකූලභාවය ප්‍රශ්න කරමින් සමාජ ක්‍රියාකාරිකයකු ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම කෙටුම්පත අභියෝගයට ලක් කරන ලදී. (Dasanayaka Mudiyanselage Dissanayake v. Attorney General–S.C. (SD) No. 72/2022) කෙටුම්පතට අනුව නියාමනය කිරීමට නියමිත වූයේ අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරණ වියදම් පමණි. පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විසින් සිදුකරනු ලබන ප්‍රචාරක වියදම් නියාමනයට ලක් කිරීමට එහි ප්‍රතිපාදන සලසා නොතිබිණි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම අඩුපාඩුව සකස් කරමින් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්ද නියාමනයට ඇතුළත් කිරීමට නියම කරන ලදී. එයට අමතරව පනත් කෙටුම්පතේ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවූ ප්‍රතිපාදන කිහිපයක්ම සංශෝධනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

පසුව 2023 ජනවාරි 19 දින මෙම කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු විවාදය පැවති අතර එහිදී පනත් කෙටුම්පත සංශෝධන සහිතව සම්මත කරන ලදී. 2023 ජනවාරි 24 වන දින කථානායකවරයාගේ සහතිකය සටහන් කිරීමත් සමග පනත බලාත්මක විය.

## 02.
## මැතිවරණ වියදම් නියාමන පනතේ මූලිකාංග

මෙම පනතේ මූලිකාංග ලෙස පහත සඳහන් අංග හඳුනාගත හැකිය.

- වියදම් නියාමනය කරන මැතිවරණ හඳුනාගැනීම.
- මැතිවරණ ප්‍රචාරක වියදම් සඳහා උපරිම මූල්‍ය සීමාවක් පැනවීම.
- මැතිවරණ ප්‍රචාරක වියදම් සඳහා පරිත්‍යාග ලබා ගැනීම තහනම් මූලාශ්‍ර හඳුන්වාදීම.
- මැතිවරණ ප්‍රචාරක වියදම් වාර්ථා තබා ගැනීම සහ වියදම් වාර්ථාවක් භාරදීම.
- මැතිවරණ ප්‍රචාරක වියදම් වාර්ථා මහජනයාට විවෘත කිරීම.
- වැරදි සහ දඬුවම් හඳුන්වාදීම.

## 03.
## පනත මගින් වියදම් නියාමනය කරනු ලබන මැතිවරණ (2 වන වගන්තිය)

- පළාත් පාලන ඡන්ද විමසීම්
- පළාත් සභා ඡන්ද විමසීම්
- පාර්ලිමේන්තු මහ මැතිවරණ
- ජනාධිපතිවරණ

මේ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් පැවැත්වීමට නියමිත ජනමත විචාරණ හැර අනෙක් සියලුම මැතිවරණ සඳහා මෙම පනත මගින් සලසා ඇති ප්‍රතිපාදන අදාළ වේ.

## 04.
## පනත මගින් නියාමනය වන පුද්ගලයන් සහ කණ්ඩායම්
## (4 වන වගන්තිය)

- ▣ මැතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන්ගේ ප්‍රචාරක වියදම්
- ▣ මැතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂවල ප්‍රචාරක වියදම්
- ▣ මැතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කර ඇති ස්වාධීන කණ්ඩායම්

## 05.
## මැතිවරණ වියදම් සීමාව (3 වන වගන්තිය)

සෑම මැතිවරණයක්ම නාමයෝජනා කාලය අවසන් වීමෙන් දින 5ක කාලයක් ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව විසින් එම මැතිවරණයට ඉදිරිපත් වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විමසා එක් අපේක්ෂකයකුට ස්වාධීන කණ්ඩායමකට හෝ දේශපාලන පක්ෂයකට ප්‍රචාරක වියදම් සිදු කිරීමේදී එක් ඡන්ද හිමියෙකු වෙනුවෙන් දැරිය හැකි උපරිම වියදම තීරණය කර ගැසට් පත්‍රයේ පල කළ යුතුය.

ඒ අනුව එම මුදල මැතිවරණයට අදාළ ඡන්ද දායකයන් ගණනින් වැඩි කිරීමෙන් එක් අපේක්ෂකයකුට හෝ දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට එම මැතිවරණයේදී වියදම් කළ හැකි උපරිම සීමාව හෙවත් අවසරලත් මුදල තීරණය කරනු ලැබේ. ඒ අනුව,

- ⦿ පළාත් පාලන ඡන්ද විමසීමකදී කොමිෂන් සභාව තීරණය කරන ලද මුදල අපේක්ෂකයා තරඟ කරනු ලබන පළාත් පාලන ආයතනයේ ඡන්ද කොට්ඨාසයේ ලියාපදිංචි මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ද,

- ⦿ පළාත් සභා ඡන්ද විමසීමකදී කොමිෂන් සභාව තීරණය කරන ලද මුදල අපේක්ෂකයා තරඟ කරනු ලබන පරිපාලන දිස්ත්‍රික්කයේ ලියාපදිංචි මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ද,

- පාර්ලිමේන්තු මැතිවරණයකදී කොමිෂන් සභාව තීරණය කරන ලද මුදල අපේක්ෂකයා තරග කරනු ලබන මැතිවරණ කොට්ඨාශයේ (දිස්ත්‍රික්කයේ ) ලියාපදිංචි මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ද,

- ජනාධිපතිවරණයකදී කොමිෂන් සභාව තීරණය කරන ලද මුදල ශ්‍රී ලංකාවේ සමස්ථ මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව ගුණ කිරීමෙන් ද, ගණනය කරනු ලැබේ.

එම වියදම් සීමාව හෙවත් අවසර ලත් සීමාවට වැඩියෙන් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කිරීම වරදකි. (2023 පළාත් පාළන ආයතන ඡන්ද විමසීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නියමකර ඇති අවසරලත් වියදම් සීමාව සඳහා 15 වන පරිච්ඡේදය බලන්න)

## 06.
## මැතිවරණ වියදම් සඳහා පරිත්‍යාග භාරගැනීම තහනම් මූලාශ්‍ර (5 වන වගන්තිය)

මැතිවරණයක ප්‍රචාරක වියදම් සඳහා විවිධ පාර්ශවයන් පරිත්‍යාග ලෙස මුදල් හෝ භාණ්ඩ හෝ සේවාවන් පරිත්‍යාග ලෙස ලබාදෙන බව නොරහසකි. පනතේ 5 වන වගන්තිය අනුව පහත මූලාශ්‍රයන්ගෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පරිත්‍යාග භාර ගැනීම තහනම් වේ.

- රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයට කොටස් යම් ප්‍රමාණයක් හිමි සමාගමකින්,
- විදේශීය රාජ්‍යයකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පුද්ගල මණ්ඩලයකින්,
- සෘජුව හෝ වක්‍රව සියයට පනහකට වඩා විදේශ කොටස් හිමිකාරත්වයක් සහිත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද පුද්ගලික සමාගම්වලින්,
- අනන්‍යතාවය හෙළිදරව් නොකරන තැනැත්තන්ගෙන්.

## 07.
## පරිත්‍යාග සහ වියදම් වාර්ථාව භාරදීමේ වගකීම
## ( 6 ( 1 ) වගන්තිය)

මැතිවරණයට ඉදිරිපත් වන සෑම දේශපාලන පක්‍ෂයක් විසින්ම, ස්වාධීන කණ්ඩායමක් විසින්ම සහ අපේක්‍ෂකයකු විසින්ම එම මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට දින 21ක් ඇතුළත මැතිවරණ වියදම් පිළිබඳ වාර්ථා අදාළ තේරීම්භාර නිලධාරියා වෙත භාරදිය යුතුය, එම වාර්ථා කොටස් 2කින් යුක්තය එනම්, (i) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් දරන ලද සියලු වියදම් පිළිබඳ වාර්තාව, (ii) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගත් හෝ භාරගත් සියලු පරිත්‍යාග හෝ දායකත්ව පිළිබඳ වාර්තාව, දේශපාලන පක්‍ෂ සම්බන්ධ වාර්ථාව දේශපාලන පක්‍ෂයේ ලේකම්වරයා විසින්ද, ස්වාධීන කණ්ඩායමට අදාළ වාර්ථාව ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින්ද, අපේක්‍ෂයාට අදාළ වාර්ථා අපේක්‍ෂකයා විසින්ද භාරදිය යුතුවේ. (වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා 14 වන පරිච්ඡේදය බලන්න) එම වාර්ථාවට එම වාර්ථාවේ සඳහන් කරුණු සත්‍ය බවට අදාළ පුද්ගලයා අත්සන් කර සාමදාන විනිශ්චයකාරවරයකු විසින් එම අත්සන සහතික කරන ලද ප්‍රකාශයකින්ද සමන්විත විය යුතුය.

## 08.
## පරිත්‍යාග පිළිබඳ වාර්ථාවට ඇතුළත් විය යුතු ලැබීම්
## (6 ( 4 ) වගගන්තිය)

(අ) ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ සියලු පරිත්‍යාග හෝ දායකත්වයන් සහ එම පරිත්‍යාග හෝ දායකත්වයන් ද්‍රව්‍යමය වශයෙන් ලැබුනේ නම් ඒ පරිත්‍යාග වල හෝ දායකත්වයන්ගේ ඇස්තමේන්තුගත වටිනාකම,

(ආ) ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් භාරගනු ලැබූවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග,

(ඇ) ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් සිදුකරන ලද තනි පුද්ගලයන්ගේ හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල අවස්ථාවෝචිත පරිදි, නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ලියාපදිංචි අංකය,

## 09.
## මැතිවරණ වියදම් වාර්ථාවට ඇතුළත් කළ යුතු වියදම් (6 ( 5 ) වගන්තිය)

(අ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම්, අත්පත්‍රිකා, ධජ, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර හෝ පෝස්ටර්, මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, ඇලවීම, ප්‍රදර්ශනය කිරීම හෝ නිරූපණය කිරීම සඳහා කරන වියදම්,

(ආ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කිරීම සහ ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රචාරය කිරීම සඳහා දරන වියදම්,

(ඇ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර පුවත්පත් වල, වාර සඟරාවල, සමාජ මාධ්‍යවල, ඩිජිටල් පුවරු හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයක හෝ වෙනත් ප්‍රකාශන වල ප්‍රකාශයට පත් කිරීම සඳහා දරන ලද වියදම්,

(ඈ) ඒ මැතිවරණයට අදාළ රැස්වීම් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයන් හෝ උපකරණ කුලියට ගැනීම හෝ භාවිත කිරීම සඳහා දරන ලද වියදම්,

(ඉ) අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහන කුලියට ගැනීම සඳහා වන වියදම් හැර ඒ මැතිවරණයට අදාළ කටයුතු සඳහා වාහන කුලියට ගැනීමේ වියදම්,

(ඊ) ඒ වාහන ධාවනයට ඉන්ධන සැපයීම සඳහා දරන ලද වියදම්.

මෙම වියදම් සඳහා ගෙවීම් සිදුකළේ ද නැද්ද යන්න පිළිබඳව තහවුරු කරන බිල්පත් සහ කුවිතාන්සි සමඟ ඉහත සේවාවන් ගෙවීමක් රහිතව ලබාගෙන ඇත්නම්, එම සේවාව ලබාගත් තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ද ඇතුළුව, පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් කළ යුතු ය.

## 10.
## වියදම් වාර්තාවට ඇතුළත් නොවන වියදම්

(අ) මැතිවරණය පැවැත්වෙන ප්‍රදේශය තුළ අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු සඳහා දරන ලද වියදම්

(ආ) ලිපි ද්‍රව්‍ය, දුරකථන හෝ වෙනත් ආකාරයේ සන්නිවේදන කටයුතු සඳහා, දරන ලද වියදම්,

## 11.
## මැතිවරණ වියදම් වාර්තාව මහජනතාවට විවෘත කිරීම (7 වන වගන්තිය)

මැතිවරණ ප්‍රචාරක වියදම් වාර්තා සහ ප්‍රකාශ ලැබීමට නියමිත දිනයෙන් පසුව එළඹෙන දින 10ක් ඇතුළත සෑම තේරීම්භාර නිලධාරිවරයකුම තමන්ට වාර්තා සහ ප්‍රකාශ ලබාදී ඇති දේශපාලන පක්ෂ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන්ගේ නම් සඳහන් කරමින් එම වාර්තා සහ ප්‍රකාශන මහජනතාවට පරීක්ෂා කළ හැකි ස්ථාන සහ වේලාවන් පිළිබඳ නිවේදනයක් සිංහල දෙමළ සහ ඉංග්‍රිසි ජාතික පුවත්පතක දැන්වීම් පල කළ යුතුය, ඒ අනුව එම වාර්තා ඕනෑම පුරවැසියකුට පරීක්ෂා කළ හැකි අතර මැතිවරණ කොමිසම නියම කරන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව පිටපතක් ලබාගත හැකිය.

## 12.
## පනත යටතේ වැරදි සහ දඬුවම්

■ **අවසරලත් මුදල ඉක්මවා මැතිවරණ කටයුතු සඳහා වියදම් කිරීම**

පනතේ 4වන වගන්තියට අනුව අවසරලත් මුදල ඉක්මවා මැතිවරණ ප්‍රචාරක වියදමක් සිදුකරන දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු වරදක් සිදුකරන අතර එය අදාළ මැතිවරණ පවත්වනු ලබන පනතේ හෝ ආඥා පනතේ සඳහන් වන "නීති විරෝධි ක්‍රියාවක්" යන වරදට ගැනෙන වරදක් බවත් ඒ අනුව අදාළ පනත හෝ ආඥා පනතේ සඳහන් දඬුවම ලැබිය යුතුය.

■ **තහනම් මූලාශ්‍රයන්ගේ පරිත්‍යාග ලබාගැනීම**

පනතේ 5 (2) වගන්තිය දක්වන්නේ පනත මගින් මැතිවරණ ප්‍රචාරක වියදම් සඳහා පරිත්‍යාග ලබාගැනීමට තහනම් කර ඇති මූලාශ්‍රයන්ගෙන් පරිත්‍යාග ලබාගන්නා දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු වරදක් සිදුකරන අතර එය අදාළ මැතිවරණ පවත්වනු ලබන පනතේ හෝ ආඥා පනතේ සඳහන් වන "නීති විරෝධි ක්‍රියාවක්" යන වරදට ගැනෙන වරදක් බවත් ඒ අනුව අදාළ පනත හෝ ආඥා පනතේ සඳහන් දඬුවම ලැබිය යුතු බවයි.

■ **මැතිවරණ වියදම් වාර්ථාව භාර නොදීම**

පනතේ 8(අ) වගන්තිය දක්වන්නේ පනතේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව මැතිවරණ ප්‍රචාරණය සඳහා ලැබූ පරිත්‍යාග සහ වියදම් පිළිබඳ වාර්ථා සහ ප්‍රකාශ නිසි පරිදි භාරදීමට අපොසත් වන දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු වරදක් සිදුකරන අතර එය අදාළ මැතිවරණ පවත්වනු ලබන පනතේ හෝ ආඥා පනතේ සඳහන් වන "නීති විරෝධි ක්‍රියාවක්" යන වරදට ගැනෙන වරදක් බවත් ඒ අනුව අදාළ පනත හෝ ආඥා පනතේ සඳහන් දඬුවම ලැබිය යුතුය.

■ **මැතිවරණ වියදම් වාර්ථාවක අසත්‍ය කරුණු පලකිරීම**

පනතේ 8(ආ) වගන්තිය දක්වන්නේ මැතිවරණ ප්‍රචාරය සඳහා ලැබූ පරිත්‍යාග සහ වියදම් වාර්ථා වල අසත්‍ය කරුණු ඇතුළත් කරන දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු වරදක් සිදුකරන අතර එය අදාළ මැතිවරණ පවත්වනු ලබන පනතේ හෝ ආඥා පනතේ සඳහන් වන "නීති විරෝධි ක්‍රියාවක්" යන වරදට ගැනෙන වරදක් බවත් ඒ අනුව අදාළ පනත හෝ ආඥා පනතේ සඳහන් දඬුවම ලැබිය යුතුය.

■ **මැතිවරණ නීති වල සඳහන් නීතිවිරෝධි ක්‍රියාව සහ දඬුවම**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරිය වූ) හි 82 ඔ(1) වගන්තිය අනුවත්, 1987 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 88 වන වගන්තිය අනුවත්, 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 87 වන වගන්තිය අනුවත්, 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනතේ 87 වන

වගන්තිය අනුවත් නීති විරෝධී ක්‍රියාවක් සඳහා වරදකරු වූ තැනැත්තෙකුට,

- වරදකරු වන අවස්ථාව වන විට ඔහු/ඇය අදාළ ආයතනයේ මහජන නියෝජිතයකු ලෙස පත්ව සිටීනම් සිය ධූරය අහිමි වීම.
- වසර 3ක් දක්වා අදාළ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම තහනම් වීම.
- වසර තුනක කාලයක් දක්වා ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීම තහනම් කිරීම.

(මෙම හේතුවෙන් වසර 3ක් දක්වා පවත්වන කිසිඳු මැතිවරණයක අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වීමේ අවස්ථාවද අහිමි වී යයි.)

- **රුපියල් 300/- ක දඩ මුදලක් නියම කිරීම,**

මෙම වරද සඳහ නඩු පැවරීම නීතිපතිගේ අනුමැතිය මත සිදුකළ යුතු අතර පළාත් පාළන ආයතන ඡන්ද විමසීම් සහ පළාත් සභා ඡන්ද විමසීම් වලදී සිදුවන නීති විරෝධී ක්‍රියා සම්බන්ධ නඩු කටයුතු මහේස්ත්‍රාත් අධිකරණ වලදී ද, පාර්ලිමේන්තු මැතිවරණ සහ ජනාධිපතිවරණවලදී සිදුවන නීති විරෝධී ක්‍රියා සම්බන්ධ නඩු පැවරීම් මහාධිකරණ වලදීද සිදුකරනු ලැබේ.

## 13.
## මැතිවරණ වියදම් නියාමනය සහ මැතිවරණ පෙත්සම්

මැතිවරණ වියදම් නියාමන පනත යටතේ වන වරදක් මැතිවරණ පනත් යටතේ එන "නීති විරෝධී ක්‍රියාව" යන වරදට යටත් වේ. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත, පාර්ලිමේන්තු මහ මැතිවරණ පනත සහ ජනාධිපතිවරණ පනත යටතේ මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කළ හැකි වරදක් ලෙස නීති විරෝධී ක්‍රියාව හඳුනාගෙන ඇත, ඒ අනුව මැතිවරණ වියදම් නියාමන පනත යටතේ සිදුකරන වරදක් පාදක කරගෙන මැතිවරණ පෙත්සමක් ගොනු කිරීමේ හැකියාව ඇත. එවැනි පෙත්සමක් සාර්ථක වුවහොත් වගඋත්තරකාර ජයග්‍රාහී අපේක්ෂකයාගේ සභික ධූරය අහෝසි වන අතර වසර 3 කාලයක්

සඳහා ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීමට ද ඒ හේතුවෙන් ම මැතිවරණ සඳහා ඉදිරිපත් වීමට නුසුදුසු වීමටද අවධානමක් පවතී.

මැතිවරණ වියදම් නියාමනය පිළිබඳ නීතියක් ක්‍රියාත්මක නොවූවද 1946 පාර්ලිමේන්තු මැතිවරණ රාජ්‍ය සභා ආඥාව යටතේ පවත්වන ලද මැතිවරණ වලදී අපේක්ෂක වියදම් වාර්ථා කිරීම පිළිබඳ ප්‍රතිපාදන පැවති අතර එම වියදම් නිසිකලට වාර්ථා නොකිරීම ඇතැම් වියදම් වාර්ථා තුළට ඇතුළත් නොකිරීම වැනි වැරදි මැතිවරණ පෙත්සම්වලදී මතුවූ අතර එවැනි අවස්ථාවලදී නිශ්චිත කාලයක් සඳහා ඡන්ද දායකයකු ලෙස ලියාපදිංචි වීම සහ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වීම ඇතැම් අපේක්ෂකයන්ට අහිමි වී ඇත.

මේ නිසා අවසරලත් මුදල ඉක්මවා වියදම් කරන හෝ මේ පනත යටතේ වෙනත් වරදක් සිදුකරනු ලබන අපේක්ෂකයන් එකී ජයග්‍රහණය කළද එම ජයග්‍රහණය අභියෝගයට ලක් කරමින් ඡන්ද පෙත්සම් ඉදිරිපත් කර ඔහු/ඇය ගේ සභික ධුරය අහිමි කිරීමේ අවස්ථාව තරංග කරන අනෙක් අපේක්ෂකයන්ට හිමිවේ.

## 14.
## පාර්ශවයන්ගේ වගකීම්

◈ **අපේක්ෂකයන්ගේ, දේශපාලන පක්ෂ ලේකම් ගේ සහ ස්වාධීන කණ්ඩායමේ නායකගේ  වගකීම**

- මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සිදුකරන වියදම් පිළිබඳව බිල්පත් සහ වාර්තා තබාගැනීම. ප්‍රචාරක කටයුතු සඳහා සිදුකරනු ලබන සියලු වියදම් දෛනිකව සටහන් තබාගැනීම මගින් පනතට අනුකූලව වගකීම් ඉටු කිරිමට පහසුවක් සලසයි. එසේම අදාළ වියදම් වලට අදාළ බිල්පත්‍රද ක්‍රමාණුකූලව රැස්කිරීම සහ සුරක්ෂිතව තබාගැනීම ඉතාමත් වැදගත් වේ.
- මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ලැබෙන ප්‍රදාන සහ පරිත්‍යාග පිළිබඳව වාර්ථා තබාගැනීම. දෛනිකව ලැබෙන මුදල්, භාණ්ඩ සහ සේවාවන් පිළිබඳව දෛනිකව වාර්ථා තබාගත යුතුය. පරිත්‍යාග සිදුකරන පුද්ගලයන්ගේ නම් ලිපිනයන්

ජාතික හැඳුනුම්පත්‍ර ආදිය පිළිබඳ විස්තර නිවැරදිව සටහන් තබාගත යුතුය. තම අනන්‍යතාව හෙළිදරව් කිරීමට අකමැති පුද්ගලයන්ගෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා මුදල් භාණ්ඩ හෝ සේවාවන් පරිත්‍යාග ලෙස ලබා නොගැනීමට වගබලාගත යුතුය.

- පනත මගින් තහනම් කර ඇති මූලාශ්‍රවලින් පරිත්‍යාග ලබා නොගැනීම. විශේෂයෙන්ම මේ පිළිබඳව අපේක්ෂකයන් තමන්ගේ ආධාරකරුවන්ද දැනුවත් කළ යුතුය.
- මැතිවරණ කොමිෂන් සභාව විසින් නියමකරනු ලබන අවසර ලත් වියදම ඉක්මවා මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් නොකිරීම.
- ඡන්ද ප්‍රතිඵල නිකුත් කර දින 21කට පෙර අදාළ තේරීම්භාර නිලධාරී වෙත මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ලැබුණ පරිත්‍යාග පිළිබඳ වාර්තාව සහ වියදම් වාර්තාව සහතික කර සාම විනිසුරුවරයකුගේ සහතිකය සහිත ප්‍රකාශයක් සමග භාර දීම.

මැතිවරණය සඳහා නාමයෝජනා ලබාදුන් සෑම අපේක්ෂකයකුගේම, දේශපාලන පක්ෂයකම සහ ස්වාධීන කණ්ඩායමක නායකයකුගේ නීතිමය වගකීමකි. මැතිවරණයෙන් ජයග්‍රහණය ලැබීම හෝ නොලැබීම මත මෙම නීතිමය වගකීම වෙනස් නොවේ.

## ◘ තේරීම්භාර නිළධාරීන්ගේ වගකීම්

- ♦ අපේක්ෂකයින්ගෙන් දේශපාලන පක්ෂවලින් සහ ස්වාධීන කණ්ඩායම් වෙතින් වියදම් වාර්ථා භාර ගැනීම.
- ♦ ජනතාවට වියදම් වාර්ථා පරීක්ෂා කිරීම සඳහා පුවත්පත් නිවේදන පල කිරීම.
- ♦ වියදම් වාර්ථා පරීක්ෂා කිරීම සඳහා පහසුකම් සැලසීම.
- ♦ මැතිවරණ කොමිෂන් සභාව නියම කරන ගාස්තු අයකර ගෙන අවශ්‍ය පුද්ගලයන් හට මැතිවරණ වියදම් වාර්ථා පිටපත් නිකුත් කිරීම.

- **මැතිවරණ කොමිෂන් සභාවේ වගකීම්**
  - එක් ඡන්ද හිමියකු වෙනුවෙන් අවසරලත් මුදල සහ මැතිවරණ වියදම් සීමාව ගැසට් පත්‍රයේ පල කිරීම.
  - වියදම් වාර්ථා පිටපත් ගාස්තු නියම කිරීම.
  - පනත යටතේ වැරදි පිළිබඳව ලැබෙන පැමිණිලි සඳහා නීතිමය පියවර ගැනීමට පොලිසිය සහ නීතිපතිවරයා සමග සම්බන්ධීකරණය.
- **පොලිසියේ වගකීම**
  - පනත යටතේ වැරදි පිළිබඳව පැමිණිලි භාර ගැනීම.
  - වැරදි පිළිබඳ විමර්ශන සිදුකිරීම.
  - නීතිපති අවසරය ලබාගෙන නඩු පැවරීම.
- **පුරවැසි වගකීම**
  - අවසර ලත් වියදම පිළිබඳ විමසිලිමත් වීම.
  - මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳව විමසිලිමත් වීම.
  - තහනම් මූලාශ්‍රයන්ගෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා මුදල් ලැබෙන්නේ දැයි විමසිලිමත් වීම.
  - පනත යටතේ වැරදි පිළිබඳව පොලිසියට මැතිවරණ කොමිෂන් සභාවට සහ මැතිවරණ නිරීක්ෂකයන් වෙත පැමිණිලි කිරීම.

## 15.
## 2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා වියදම් සීමාව

2023 ජනවාරි මස 25 මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව මැතිවරණ ප්‍රචාරක වියදම් සීමාව පහත පරිදි වේ.

### කොට්ඨාශයක් සඳහා තරඟ කරන අපේක්ෂකයකුගේ උපරිම වියදම් සීමාව

අපේක්ෂකයා තරඟ කරනු ලබන කොට්ඨාශයේ වලංගු ඡන්ද දායකයන් සංඛ්‍යාව රුපියල් 20න් වැඩිකළ විට ලැබෙන මුදල. උදාහරණයක් ලෙස කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යව දහසක් නම් එම

අපේක්ෂකයාට වියදම් කළ හැකි උපරිම මුදල වන්නේ රුපියල් විසිදහසකි.

### ▣ **දෙවන නාමයෝජනා ලැයිස්තුවෙන් තරඟ කරන අපේක්ෂකයකුගේ උපරිම වියදම**

රුපියල් 20/- පළාත් පාලන ආයතයේ සමස්ථ ඡන්දදායකයන් ගණානින් වැඩි කර ලැබෙන මුදලින් 40% ක මුදල එකී එම දෙවන ලැයිස්තුවේ සඳහන් අපේක්ෂකයන් ගණනින් බෙදූ විට ලැබෙන මුදල දෙවන ලැයිස්තුවේ එක් අපේක්ෂකයකුට වියදම් කළ හැකි උපරිම සීමාව වේ.

උදාරණයක් ලෙස යම් පළාත් පාලන ආයතනයක ඡන්දදායකයන් ලක්ෂයක් සිටී නම් සහ දෙවන ලැයිස්තුවේ අපේක්ෂකයන් 10ක් සිටියි නම්

- ♦ සමස්ථ වියදම (20 x 10,0000)= ලක්ෂ 20යි
- ♦ දෙවන ලැයිස්තුවේ අපේක්ෂකයන්ට හිමි වියදම (2,000,000 x 40 % ) = ලක්ෂ 8යි
- ♦ දෙවන ලැයිස්තුවේ එක් අපේක්ෂකයකුට හිමි වියදම (800,000 ÷10) = අසූදහසයි

දෙවන ලැයිස්තුවේ එක් අපේක්ෂකයකුට වියදම් කළ හැකි උපරිම සීමාව රුපියල් අසූ දහසකි.

### ◘ දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක උපරිම වියදම් සීමාව

රුපියල් 20/- පළාත් පාලන ආයතයේ සමස්ථ ඡන්දදායකයන් ගණානින් වැඩි කර ලැබෙන මුදලින් 60% ක මුදල පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සඳහා වියදම් කළ හැකි උපරිම සීමාව වේ.

උදාරණයක් ලෙස යම් පළාත් පාලන ආයතනයක ඡන්දදායකයන් ලක්ෂයක් සිටී නම්

- ♦ සමස්ථ වියදම (20 x 10,0000)= ලක්ෂ 20යි

- දේශපාලන පක්ෂයට/ස්වාධීන කණ්ඩායමට හිමි වියදම
  (2,000,000 x 60 % ) = ලක්ෂ 12 යි

එම පලාත් පාලන ආයතනය සඳහා තරඟ කරන දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වියදම් කළ හැකි උපරිම සීමාව රුපියල් ලක්ෂ 12 කි.

එක් එක් පළාත් පාලන ආයතන සඳහා ගණනය කරන ලද උපරිම මැතිවරන වියදම 2023 ජනවාරි 25 දින මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 2316/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත. එම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

PAFFREL

PEOPLE'S ACTION FOR FREE AND FAIR ELECTIONS

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571
Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.com